# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 635 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 13/04/2024 පැය 1220

**මාධ්‍ය නිවේදනය**

**සිංහල හා හින්දු අළුත් අවුරුදු සමයේ විශේෂ ආරක්ෂක වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම - පොලිස් මූලස්ථානය.**

2024 සිංහල හා හින්දු අළුත් අවුරුද්ද උදාවත් සමඟ මහජනතාව වැඩි වශයෙන් ඒකරාශී වන අළුත් අවුරුදු උත්සව, සංගීත සංදර්ශන, සැණකෙළි හා වෙනත් උත්සව වලදී මහජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් විශේෂ පොලිස් ආරක්ෂාවක් යෙදවීමට පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා විසින් සියළුම පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්, කොට්ඨාස භාර නිලධාරීන් ඇතුළු සියළුම පොලිස් ස්ථානාධිපතිවරුන් වෙත උපදෙස් ලබාදී ඇත.

දිවයින පුරා අළුත් අවුරුදු උත්සව, සංගීත සංදර්ශන, සැණකෙළි හා වෙනත් උත්සව 4500 කට ආසන්න ප්‍රමාණයක් සංවිධානය කර ඇති අතර එම උත්සව සඳහා සහභාගී වන මහජනතාවගේ ආරක්ෂාව සඳහා පොලිස් නිලධාරීන් 14000 කට ආසන්න ප්‍රමාණයක්, පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් 500 කට ආසන්න ප්‍රමාණයක් සහ ත්‍රිවිධ හමුදා නිලධාරීන් 400 කට ආසන්න ප්‍රමාණයක් යෙදවීමට අපේක්ෂා කර ඇත. තවද සිවිල් ආරක්ෂක කමිටු සාමාජිකයින් 15806 ක් මෙම උත්සව සංවිධාන කටයුතු හා සම්බන්ධීකරණය කටයුතු සඳහා යෙදවීමට නියමිතව ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**